# නිවේදකයා ගේ භූමිකාව




නිවේදකයා ගේ කාර්ය භාරයත් තෙල් බෙත් වෙළෙන්දා ගේ රාජකාරිය වගේම දැයි මට කල්පනා වූයේ පසුගිය දිනෙක නාට්‍ය සංදර්ශනයක් නරඹන අතර ය.

තමා විකුණන තෙලේ බලය වර්ණනා කරන වෙළෙන්දා එය පාවිච්චි කර එහි බලය වටහා ගන්නැයි බලා සිටින පිරිසට කියන්නේ ය. බොහෝ විට තෙල් අරගෙන ගෙදර යන පාරිභෝගිකයා එහි හොඳ නරක අවබෝධ කර ගන්නා විට වෙළෙන්දා පළාතෙන් ද පිටවී හමාර ය.

ඒ අතින බලන විට නිවේදකයා මුහුණ පාන්නේ ඊට වඩා බරපතළ කාරියකට ය. මගේ

කළේ මගේ ලංසුවට අනුව නම් ප්‍රේක්ශකයාට අවමානයකි. වෙනත් වචනයෙන් කියතොත් ප්‍රේක්ශකයාගේ වින්දන ශක්තිය අවතක්සේරු කිරීමකි.

සාර්ථක නිවේදනය වශයෙන් ගත හැක්කේ නිර්මාණය සහ වින්දනය අතර පරතරය මග හැරෙන තරමට ය. මග හරවනවා යයි කියන්නේ නිර්මාණයේ රස වින්දනයට උචිත අත්වැලක් සැපයීම ය. අවශ්‍ය සහය සැළසීම ය.

නිර්මාණය ඔස්සේ නිර්මාණකරුවා ප්‍රේක්ෂකයාට සමීප කිරීම මෙහිලා අනිවාර්යයෙන් ම සිදුවන්නකි. එසේ පහසුවක් සපයනු වස්

නිර්මාණයක් ප්‍රේක්ෂකයාගේ අවධානය රැක ගනිමින් ඔවුන් පිනවීමට සමත් නොවන තැන දී ඒ



මදි පාඩුව පිරිමැසීම සඳහා වේදිකාවට එවන්නකුගේ තැනට නිවේදකයා පත් වීඹ ඔහුගේ නොහොත් ඇයගේ භූමිකාව සපුරා බිඳ දැමීමකි. හාස්‍යයට ලක් කිරීමකි.

මම නැවතත් මුලින් සඳහන් කළ නිවේදිකාව දෙසට හැරෙමි. කීමෙහි බිණීමෙහි සමත් ඇය තමා විසින් කරන ලද වර්ණනාව නිසා අත්පොළසන් දුන්නවුන්ගේ ප්‍රතිචාරය ගැනත් කල්පනා කරමින් තමා ලත් ජයග්‍රහණය පිළිබඳ අභිමානයක් ලබන්නටත් ඇත . එසේ අත්පොළසන් දුන් පිරිස වැඩි හරියක් වේදිකාව මත සිය දස්කම් පානා කුඩා දරු දැරියන්ගේ දෙමාපියන් බව ඇය දැන සිටියා දැයි නොදනිමි. පුංචි එවුන් කොහොම නැටුවත් අම්මලා තාත්තලා අත්පුඩි ගහනවාම ය. නැටුම අගය කරනවාම ය.

හිතට යට කී ප්‍රශ්නය ගෙන ආවේ නිවේදිකාවකි. චතුර කථිකාවක වූ ඇය එක්තරා නැටුමක් වේදිකාවට එවන්නට කලින් වර්ණනා කළා පමණක් නොවේ. නළුවන් වේදිකාවෙන් පිට වූවාට පසු නැවතත් ඒ වර්ණනාවම වෙන වචන වලින් ඉදිරිපත් කරමින් තවත් වරක් අත්පොළසන් දෙන්නැයි ප්‍රේක්ශකයන්ගෙන් ඉල්ලා සිටියා ය. මෙසේ නැවත අත්පොළසන් දීම වූ කලී කිසියම් දර්ශනයක නොහොත්

*මෙහි ලා නිවේදකයා ප්‍රේක්ෂකයාට ගුරුහරුකම් දීම පරිස්සමින් කළ යුතු ය. තමා ප්‍රේක්ෂකයාට වඩා දැනුම් තේරුම් ඇත්තකු වුවත් ඒ බව යටපත් කරගෙන ප්‍රේක්ශකයා හෑල්ලු නොවන විදියට කතා කිරීමට ද නිවේදකයා සමත් විය යුතු ය.*

ගායනයක අගය පිළිගන්නා බව තහවුරු කරන විවෘත සංඥාවකි.

නිවේදකයාගේ කාර්යභාරය කුමක්ද යන ප්‍රශ්නය මතු කළ යුත්තේ යට කී තත්වය නිසා ය. 2010 නොවැම්බර් 30 වැනි දා මොනෑෂ් සරසවියේ ඇලෙක්සැන්ඩ්‍රා රඟහලේ දී සිය ගායනා ඉදිරිපත් කළ නන්දා මාලිනී නිවේදකයකුගේ සහය නොසෙව්වේ එබන්දකු සොයා ගැනීම අපහසු නිසා නොවේ. ඉඩ දුන්නා නම් ඒ කාරිය ඉටු කරන් වස් ඉදිරියට එන්නට සෑහෙන ගණනක් මෙල්බර්න් නුවරින් සොයා ගත හැකි බව නොකිව යුතු ය.

නන්දා මාලිනී නිවේදක සහය නොලබා සිය සන්දර්ශනය ඉදිරිපත් කිරීම ඇගේම තීරණය අනුව සිදුවූවක්දැයි නොදනිමි. හේතුව කවරක් වුවත් එයින් කිසිදු හානියක් නොසිදුවූ බව කිව යුතු ය. එපමණක් නොවේ. දිගින් දිගටම කලාකරුවන් වර්ණනා කරමින් අනවශ්‍ය වැල්වටාරම් කියන නිවේදකයන් කරන්නේ මූලික කාර්යයට අනුග්‍රහයක් නොව අවහිරයකි. මා මුලින් සඳහන් කළ නිවේදිකාව

නිවේදකයා සපයන තොරතුරු අතර විටෙක කලාකරුවාගේ අත්දැකීමක් - නිර්මාණයට හේතු වූ සිද්ධියක් - බඳු විස්තර ප්‍රේක්ෂකයා දැනුවත් කිරීමේ ප්‍රබල සාධක ද වන්නේ ය. මේ කරුණ නන්දා මාලිනීගේ යට කී සන්දර්ශනයේ දී ප්‍රකට විය. තමා කිසියම් ගීයක් ගැයීමට යොමු වූයේ කෙසේ ද යන්න ඇය පැහැදිලි කළා ය.

මෙහි ලා නිවේදකයා ප්‍රේක්ෂකයාට ගුරුහරුකම් දීම පරිස්සමින් කළ යුතු ය. තමා ප්‍රේක්ෂකයාට වඩා දැනුම් තේරුම් ඇත්තකු වුවත් ඒ බව යටපත් කරගෙන ප්‍රේක්ශකයා හෑල්ලු නොවන විදියට කතා කිරීමට ද නිවේදකයා සමත් විය යුතු ය.

වසර දෙක තුනකට උඩ මෙල්බර්න් සංගීත සන්දර්ශනයක දී නිවේදකයා ප්‍රේක්ෂකයාට රස වින්දනයේ මූලධර්ම උගන්වන්නට ගිය හැටි මට මතක් වෙයි. එයට ලැබුණු ප්‍රතිචාරයත් මට මතක ය. ප්‍රේක්ශකයා ප්‍රකෝප කිරීම කිසි විටක නිවේදකයා අතින් සිදු විය යුතු නොවේ. ඒ ඔහුගේ රාජකාරිය පැහැර හැරීමක් පමණක් නොවේ. රාජකාරියේ ලංසුව පහළට බැස්සීමක් ද වෙයි.

මැද පෙරදිග සන්දර්ශන සඳහා ශ්‍රී ලංකාවෙන් යන ගායකයන් සමග අනිවාර්යයෙන්ම යන නිවේදකයකු ගැන වරක් අසන්නට ලැබුණේ ය. ඒ වතාවේ ඔහු කීවේ වාර තිස් ගණනක් තමන් එසේ ගොස් ඇති බව ය. එයින් පෙනී යන එක් කරුණක් වනුයේ ගායනය තරමට ම නිවේදනය අගය කරනු ලබන බව යයි සිතමි. මෙය වැඩිකොටම සිදුවන්නේ කලාකරුවන් හෝ ගායකයන් සමූහයක් එක්ව ඉදිරිපත් කරන ගායනයක් බඳු තැනකදී ය. නිවේදකයා ඒ සියලු දෙනාගේ ම ගායනා ඔස්සේ ප්‍රේක්ෂකයාගේ අවධානයත් උද්යෝගයත් නොපිරිහී රඳවා ගන්නා සූත්‍රධාරියා බවට එහි දී පත් වන්නේ ය.

නිවේදකයාට හිමි වන මේ සුවිශේෂ භූමිකාව සුළු කොට තැකිය යුතු නොවේ. අගය කළ යුතු අතර ම අවධාරණය කළ යුතු වැදගත් කරුණ වනුයේ ගායනයත් වාදනයත් නැත හොත් අන් කවර හෝ

■

From Page 12

government did do one thing, that is to celebrate their victory over the terrorists, not once but over and over again. There were victory parades, award giving ceremonies, unveiling of memorials and statues in honor of heroes, award of houses to widows of war heroes, and a number of such functions. Some of these were absolutely essential, but were all these really necessary?

The question of priority come up here, as to what should be done immediately as to what should be done immediately and what can be put off for a future day. What the government in its enthusiasm over the victory did was to mix up priorities wholesale and carry on with the absolutely unnecessary the cosmetic operations. The question that seems to have escaped the notice of those responsible is the importance of a historical perspective. Past is not for us to live on, but to build on. That is why those without the appreciation of the past fail in their duty as advisors or even simple operators.

Those who do not know Coomaraswamy cannot fathom the depth of feelings of the aggrieved parties in Sri Lanka's recent ethnic struggle. They failed to tell their boss that immediate attention ought to be paid to that question and solve it once and for all. Not having done the absolutely essential duty they are now joining their boss in arranging street protests and Bodhi Pujas in order to avoid international condemnation on the question of human right s and many other issues.

The advisors whom do not known Coomaraswamy did not also know that the rest of the world was watching Sri Lanka all the while. That included India too who had been asking Sri Lanka to sort it out for a long time.

Dumping Coomaraswamy means ignoring history and reality. ■

